පොලිස් මාධ්‍ය කොට්ඨාසය
பொலிஸ் ஊடகப் பிரிவு
POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | |
|---|---|---|---|
| දිනය Date | 2025.04.06 පැය 1700 | දුරකථන අංකය Tel.NO | 011-2887973 |
| මගේ අංකය My NO | D/Media/Out/663/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |

**වැලිකඩ පොලිස් භාරයේ සිටියදී රෝහල් ගත කරන ලද සැකකරුවෙකු මියයාමේ සිද්ධියට අදාලව සාධාරණ හා අපක්ෂපාතී පරීක්ෂණයක් සිදු කිරීම සඳහා වැලිකඩ පොලිස් ස්ථානාධිපතිවරයා එම ධූරයෙන් ඉවත් කිරීම හා තවත් නිලධාරීන් දෙදෙනෙකු රාජකාරි වැඩ තහනමට ලක් කිරීම.**

2025.04.01 වන දින රාත්‍රී කාලයේ වැලිකඩ පොලිස් වසමේ නාවල ප්‍රදේශයේ නිවසකට ඇතුළු වී සිටි පුද්ගලයෙකු අත්අඩංගුවට ගැනීමෙන් පසු කලහකාරී ලෙස හැසිරීම හේතුවෙන් නිලධාරීන් විසින් සැකකරු රෝහල් ගත කිරීමෙන් පසු මිය යෑමේ සිද්ධියට අදාළව විමශර්න කටයුතු අපරාධ පරීක්ෂණ දෙපාතර්මේන්තුව වෙත යොමු කර ඇත.

ඒ අනුව, මෙම සිද්ධිය සම්බන්ධයෙන් සාධාරණ සහ අපක්ෂපාතී පරීක්ෂණයක් සිදු කිරීම සඳහා වැලිකඩ පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිවරයා එම ධූරයෙන් ඉවත් කිරීම සඳහා වන නිදෙර්ශ 2025.04.06 වන අද දින වැඩබලන පොලිස්පතිවරයා විසින් ජාතික පොලිස් කොමිසම වෙත ඉදිරිපත් කිරීම සඳහා මහජන ආරක්ෂක හා පාලරීමේන්තු කටයුතු අමාත්‍යංශය වෙත යොමු කිරීමට කටයුතු කරන ලදී.

එමෙන්ම මෙම සිදුවීමේදී තම රාජකාරිය පැහැර හරින ලද බවට නිරීක්ෂණය වූ පොලිස් සැරයන්වරයෙකුගේ සහ පොලිස් කොස්තාපල්වරයෙකුගේ වැඩ තහනම් කිරීමට ද කටයුතු කර ඇත.

සිද්ධිය සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාතර්මේන්තුව විසින් වැඩිදුර විමශර්න සිදුකරගෙන යනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**